**දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ (CRIWMP) කටයුතු - 2021**

---

දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ (CRIWMP) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, හරිත දේශගුණික අරමුදල (GCF) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) අතර 2016 අගෝස්තු 05 දින එළඹි ප්‍රදාන ගිවිසුමේ 17.01 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව, වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ.
දේශගුණික විපර්යාසවල අවදානම් සහ බලපෑම් වලට එරෙහිව ආහාර සුරක්ෂිතතාව, සෞඛ්‍යය සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා ජල කළමනාකරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් හරහා වියළි කලාපයේ කුඩා වතු හිමියන්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ ජීවන තත්ත්වය සහ ජීවනෝපාය ඉහළ නැංවීමට ශ්‍රී ලංකා රජයේ දැක්මට සහාය වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. වියළි කලාපයේ ගංගා ද්‍රෝණී තුනක ග්‍රාමීය වාරිමාර්ග පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම හා දේශගුණික බලපෑම් අවම වන පරිදි ගොවිතැන් ක්‍රම පුළුල් කිරීම, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට ආරක්ෂිත පානීය ජලය සඳහා වසර පුරා ප්‍රවේශය ලබා දීම සඳහා දේශගුණික බලපෑම් අවම වන පරිදි විමධ්‍යගත ජල සැපයුම සහ කළමනාකරණ විසඳුම් වැඩිදියුණු කිරීම, ජල කළමනාකරණය සහ කුඩා වතු හිමියන්ගේ නියඟයට සහ ගංවතුරට අනුවර්තනය වීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා දේශගුණ හා ජල විද්‍යාත්මක නිරීක්ෂණ සහ පුරෝකථන පද්ධතිය ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය යන සංරචක හතරක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.
ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 7,521.45 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 52.084 ක් වන අතර ඉන් රු. මිලියන 5,499.71 කට සමාන වූඑ.ජ.ඩො. මිලියන 38.084 ක් සැපයීම සඳහා හරිත දේශගුණික අරමුදල (GCF) සමඟ එකඟ වී තිබුණි. ශ්‍රී ලංකා රජය විසින් ඉතිරි රු.මිලියන 2,021.74 මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2017 ජූලි මස ආරම්භ කරන ලද අතර 2024 ජුනි වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය ව්‍යාවනය**

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් මතයක් ප්‍රකාශ නොකරමි. මාගේ වාර්තාවේ 2 වන කොටසෙහි සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

පහත නිරීක්ෂණ සිදුකරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 ජූලි සිට 2024 ජූනි දක්වා කාලය සඳහා ශ්‍රී ලංකා රජයට (GOSL) රු. මිලියන 5,499.71 කට සමාන එ.ජ.ඩො. මිලියන 38.084 ක් ලබා දීම සඳහා 2017 ජූනි 07 දින එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ හරිත දේශගුණික අරමුදල (GCF) අතර අරමුදල් සහිත ක්‍රියාකාරකම් ගිවිසුමක් (ප්‍රදාන) අත්සන් කර තිබුණි. ගිවිසුමට අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය (MMDE) ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) ප්‍රතීතනය ලත් ආයතනය වේ. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික විපර්යාස හේතුවෙන් කුඩා වතු හිමියන් මුහුණ දෙන ගැටලු අවම කිරීම ව්‍යාපෘතියේ අරමුණ වන අතර 2016 ඔක්තෝබර් 04 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි. අරමුදල් සහිත ක්‍රියාකාරකම් ගිවිසුමේ (FAA) 3 වන වගන්තියට අනුව, එ.ජ.ඩො. මිලියන 38.084 කට සමාන මුදලක්, අරමුදල් ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය සම්පාදනය කිරීමේ අරමුණ ඇතිව සහ සහය වීමට ප්‍රතීතනය ලත් ආයතනය (UNDP) විසින් ක්‍රියාත්මක කරවීමේ ආයතනය (MMDE) වෙත ප්‍රදානයක් ආකාරයෙන් ලබා දෙනු ලැබේ. හරිත දේශගුණික අරමුදල පසුගිය වසර 04 තුළ රු. මිලියන 3,774.17 කට සමාන එ.ජ.ඩො. මිලියන 22.23 ක් (UNDP) වෙත ලබා දී තිබුණද, 2021 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 1,128.09 කට සමාන එ.ජ.ඩො. මිලියන 6.96 ක් පමණක් (MMDE) වෙත ලබා දී තිබූ අතර ඉතිරි රු.මිලියන 2,646.08 කට සමාන එ.ජ.ඩො. මිලියන 15.27 ක මුදල ව්‍යාපෘතියේ කටයුතු කිහිපයක් සිදුකිරීම සඳහා (UNDP) විසින් වැය කර තිබුණි. | GCF වෙතින් අරමුදල් ලබා දීම සම්බන්ධයෙන් කිසිදු විශේෂිත තහවුරු ලිපියක් ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMU) කාර්යාලයේ නොතිබුණද, අදාල කාලය සඳහා අරමුදල් ලබා දීම ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තා (CDR) තුළින් තක්සේරු කරගත හැකි විය. UNDP (ප්‍රතීතනය ලත් ආයතනය) වෙතින් අරමුදල් ලබාදීම ආරම්භ කිරීමේ ලිපියක් දැනට ලැබී ඇත. | අරමුදල් සපයන නියෝජිතායතනය අරමුදල් මහබැංකුව හරහා යොමු කර ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා යොදවා ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබා දී තිබූ සම්පූර්ණ මුදලින් සියයට 30 ක් නියෝජනය වන ක්‍රියාත්මක කරවීමේ ආයතනයේ (MMDE) මුදල පමණක් ඇතුලත්කර මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබූ බැවින්, සමස්ත ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය එමගින් පිළිබිඹු නොවන අතර මාගේ විගණන කටයුතු (MMDE) විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් වෙත පමණක් සීමා විය. | | |
| (ආ) | රු. මිලියන 458.09 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.3 ක් වටිනා බැඳීම් ගාස්තු හා සහතික නොකළ කළවැඩ සම්බන්ධ වගකීම් UNDP විසින් ඉදිරිපත් කළ ඒකාබද්ධ බෙදා හැරීමේ වාර්තා තුළ ඇතුලත් ව නොතිබුණි. කෙසේ වෙතත් එම බැඳීම් ගාස්තු හා සහතික නොකළ වැඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | PMU විසින් සිදුකරන ලද ඉදිකිරීම් වැඩ සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පෙර සම්පූර්ණයෙන් ගෙවා ඇත. මේ සඳහා කළ වැඩ සම්බන්ධ බිල්පත් දෙසැම්බර් 15 වෙනි දින හෝ ඊට පෙර කැඳවන ලදි. තවදුරටත් UNDP (ප්‍රතීතනය ලත් ආයතනය) විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය පරිදි බැඳීම් සඳහා කිසිදු වෙන් කිරීමක් සිදු නොකරයි. | සියලු වගකීම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරවු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | GCF සහ GOSL විසින් රු. මිලියන 1,128.09 ක් හා රු. මිලියන 1,089.96 ක් 2021 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිළිවෙළින් හිමිකම හා වගකීම් යටතේ මූල්‍යනය කරන ලද බව දක්වා තිබුණි. කෙසේ වෙතත් පසුගිය වසර 4 තුළ GCF මුදල් ලබා දීම් සහ GOSL දායකත්වය පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල වෙනමම හෙළිදරවු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමඟ විස්තර ඇතුලත් ලැයිස්තුවක් අමුණා නොතිබුණද, හිමිකම හා වගකීම් සම්බන්ධයෙන් සියලු විස්තර ලබා දීමට PMU ට හැකිය. අනාගතයේදී මෙය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කෙරෙනු ඇත. | සියලු අදාළ විස්තර මූල්‍ය ප්‍රකාශන අයිතම යටතේ හෙළිදරවු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 වන ඡේදය අනුව, වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. (SLPSAS) මගින් අවශ්‍ය හෝ අවසර දී ඇති විටකදී හැර එකිනෙක නොගැලපිය යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 87.3 ක් හා රු. මිලියන 38.9 ක් වටිනා පිළිවෙලින් ජංගම වත්කම් හා ජංගම වගකීම් අගයන් එකිනෙකට ගලපා ශුද්ධ වටිනාකම වූ රු. මිලියන 48.4 ක් වියදමක් ලෙස නිමවුම 01 යටතේ ගිණුම්ගත කර තිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස නිමවුම 01 හි මුළු වියදම එම වටිනාකමින් වැඩියෙන් සඳහන් කර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. අනාගතයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. | ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. (SLPSAS) අවශ්‍යතාවයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘති ලේඛනයේ 7 කොටසේ 69 වන වගන්තිය | 2021 ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව අනුමත කිරීමේදී, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අදාළ වියදම් පමණක් වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් සහතික කර තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. කෙසේ වෙතත් ව්‍යාපෘති වියදම් සම්බන්ධයෙන් විස්තරාත්මක ලිඛිත සාක්ෂි සහ අනෙකුත් විස්තරාත්මක තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම පරිපාටිය හඳුන්වා දී ඇත. | කිසිඳු කොන්දේසියකින් තොරව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව අනුමත කළ යුතුය. |

### 3. භෞතික කාර්යසාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| අරමුදල් සහිත ක්‍රියාකාරකම් ගිවිසුමේ (FAA) උප ලේඛන 3 ට අනුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වෙතත් FAAහි මෙම වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදුකර නොතිබුණි. එසේම වාරිමාර්ග අමාත්‍යාංශය සහ ප්‍රතීතනය ලත් ආයතනය (UNDP) විසින් සම්පූර්ණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදුකර තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. | ගිවිසුමට අනුව අදාල පාර්ශවයන්ගෙන් සම-මූල්‍යකරණය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 පද්ධති හා පාලනයන්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ අයවැයගත ප්‍රතිපාදනය රු. මිලියන 1,000 ක් වූ අතර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම්ගත වියදම රු. මිලියන 108 ක් විය. ඒ අනුව UNDP විසින් දරන ලද රු. මිලියන 636.8 ක් වටිනා වියදම අමාත්‍යාංශය යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. | ව්‍යාපෘතිය යටතේ දරන ලද සියලු වියදම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතිය යටතේ හරිත දේශගුණික අරමුදල වෙතින් UNDP ගිණුම වෙත එ.ජ.ඩො. මිලියන 22.23 ක් වටිනා අරමුදල් ලැබී තිබුණද විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SC&PMU/Grant/19 හා 2019 ජූලි 25 දිනැති ලිපිය අනුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ (ඩොලර්) ගිණුමක් විවෘත කර නොතිබුණි. | GCF විසින් මේ දක්වා එ.ජ.ඩො. මිලියන 21.6 ක අරමුදල් පමණක් නිකුත් කර තිබුණි. ප්‍රතීතනය ලත් ආයතනය හරහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත අරමුදල් යැවීම GCF හී අරමුදල් ලබා දීමේ පරිපාටිය වේ. එම නිසා ඩොලර් ගිණුමක් විවෘත කිරීම සඳහා අවශ්‍යතාවයක් නොමැත. | විදේශ ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා නිවැරදි යාන්ත්‍රණයක් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | FAA හි 7 වන වගන්තිය ප්‍රකාරව, වාර්තා කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම උප ලේඛන 04 අනුව සිදුකළ යුතුය. ව්‍යාපෘති ක්‍රියාකාරකම් වාර්තා කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා ව්‍යාපෘතිය විසින් නිසි පරිදි ප්‍රගතිය වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් සකස් කළ යුතුය. මෙම කාර්යය සඳහා, ව්‍යාපෘති ප්‍රතිලාභ, ප්‍රතිලාභවල ප්‍රමාණය සහ එක් එක් සහ සියලු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ කාල සැලැස්මක් ව්‍යාපෘතිය මඟින් හඳුනාගත යුතුය. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ, ප්‍රතිලාභීන් සහ අයවැය ගත ඉලක්ක මත පදනම්ව වාර්ෂික වැඩ සැලැස්මක් සකස් කළ යුතුය. PMU හා UNDP යන දෙපාර්ශවයෙන්ම විමසන ලද නමුත් නිසි ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. එමනිසා ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කිරීමට නොහැකි විය. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. නිසියාකාරව ව්‍යාපෘති ප්‍රගතිය තක්සේරු කළහැකි ප්‍රගති වාර්තාවක් නියමිත කාලය තුළ ඉදිරිපත් කෙරේ. | වාර්ෂික වැඩ සැලැස්ම හා ප්‍රගති වාර්තාව සකස්කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |